## ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය

1. **මූල්‍ය ප්‍රකාශන**

1:1 **තත්ත්වාගණනය කළ මතය**

මෙම වාර්තාවේ 1.2 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2011 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා එහි මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 **මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

1.2.1 **ගිණුම්කරණ ප්‍රතිපත්ති**

ආයතනයේ ගිණුම් තැබීමේදී ආදායම් සඳහා මුදල් පදනමද, වියදම් සඳහා උපචිත පදනමද අනුගමනය කර තිබුණි.

1.2.2 **ගිණුම්කරණ අඩුපාඩු**

පහත සඳහන් ගිණුම්කරණ අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ). සමාලෝචිත වර්ෂයේදී රු.322,320 කට මිලදීගත් වායුසමීකරණ යන්ත්‍ර 04 ක වටිනාකම කාර්යාල උපකරණ ගිණුමට ගිණුම්ගත කර නොතිබූ බැවින්, එම වටිනාකමින් කාර්යාල උපකරණ ගිණුම අඩුවෙන් දකවා තිබුණි.

(ආ). 2011 දෙසැම්බර් 31 දිනට සිදු කරන ලද භෞතික තොග සත්‍යාපනයේදී රු.343,902 ක් වටිනා කල් ඉකුත් වූ රසායන ද්‍රව්‍ය තොගයක්ද රු.494,893 ක චලනය නොවන හා රු.407,467 ක සෙමින් චලනය වන පාරිභෝජන ද්‍රව්‍ය තොග වෙනුවෙන් ගිණුම්වල ගැලපීම් කර නොතිබුණි.

1.2.3 **ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ). 2011 දෙසැම්බර් 31 දිනට වෙළෙඳ ණයගැති ශේෂය රු.6,065,416 ක් වූ අතර විධිමත් කාල විශ්ලේෂණ පිළියෙළ කර නොතිබූ බැවින් මෙම මුදල් ආයතනය වෙත අයකර ගැනීමේ හැකියාව නිශ්චය කළ නොහැකි විය. තවද, ණයගැති ශේෂය ගිණුම් 56 කින් සමන්විතවී තිබූ අතර කිසිදු ආයතනයක් ශේෂ සනාථ කර නොතිබුණි.

(ආ). ගිණුම් 11 කින් සමන්විත වී තිබූ වෙළෙඳ ණයහිමි ශේෂ සම්බන්ධව ආයතන 03 ක් ශේෂ සනාථ ලිපි එවා තිබුණද එම ආයතනද ණයහිමි ශේෂ හා එකඟවී නොතිබුණි. ඒ අනුව ණයහිමි භාවය පිළිබඳ සෑහීමකට පත්විය නොහැකි විය.

(ඇ). විවිධ ගිණුම් 23 ක වූ රු.3,966,497 ක ශේෂ ඉතා දීර්ඝ කාලයක සිට නිරවුල් කිරීමට කටයුතු නොකර ශේෂ ඉදිරියට ගෙන එමින් තිබුණි.

### 1.2.4 විගණනය සඳහා සාක්ෂි නොවීම.

පහත සඳහන් ගිණුම් විෂයයන් ඉදිරියෙන් දක්වා ඇති සාක්ෂි ඉදිරිපත් නොකෙරුණි.

| විෂයය | වටිනාකම රු. | නොසැපයූ සාක්ෂි |
|---|---|---|
| ලී බඩු හා උපකරණ | 10,775,698 | එක් එක් වත්කමෙහි අවසානයට ශේෂය දැක්වෙන උපලේඛණ භාණ්ඩ සමීක්ෂණ වාර්තා |
| කාර්යාල උපකරණ | 59,700,842 | |
| විද්‍යාගාර උපකරණ | 551,469,995 | |
| විද්‍යාගාර ලී බඩු | 3,942,687 | |
| පුස්තකාල පොත් | 15,049,540 | |

### 1.2.5 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

පහත සඳහන් නීති, රීති රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| නීති, රීති රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) 1984 අංක 6 දරන ශ්‍රී ලංකා ප්‍රමිති ආයතන පනත | i. පනතේ 19(1) හෝ 23 වන වගන්තියේ විධිවිධාන උල්ලංඝනය කරන හෝ ඒ අනුව ක්‍රියා කිරීම, පැහැර හරින තැනැත්තන් මෙම පනත යටතේ වරදක් කරන්නේය යන බවත්, 46(1) අනුව, එවැනි වැරදිකරුවන් සඳහා නීතිමය කටයුතු වලට යොමුවීම හා ඒ සඳහා අඩුවම් ලබා දියහැකි වුවද, එවැනි උල්ලංඝණය කිරීම් සඳහා ආයතනය අවශ්‍ය නීතිමය පියවර ගෙන නොතිබුණි. |
| | ii. පනතේ 3(ඒ) වගන්තියට අනුව අධ්‍යාපන, උපදේශන හා වෙනත් මාර්ග වලින් ප්‍රමිතිකරණය හා තත්ත්ව පාලනය සිදු කළයුතු වුවත්, කර්මාන්ත හා තාක්ෂණ ආයතනවල පරීක්ෂණාගාර සේවා අංශ කටයුතු ප්‍රවර්ධනය කිරීම සඳහා වර්ෂය තුළදී පවත්වා තිබුණේ පුහුණු පාඨමාලා 3 ක් පමණි. |
| (ආ) 1971 අංක 38 දරන මුදල් පනතේ 10(5) වගන්තිය. | ශුද්ධ අතිරේක ආදායමින් ඉතිරි සියළු මුදල් ඒකාබද්ධ අරමුදලට ගෙවනු ලැබිය යුතු වුවත් පසුගිය වර්ෂ 5 තුළ උපයන ලද ලාභ ඒකාබද්ධ අරමුදලට ගෙවා නොතිබුණි. |

| වර්ෂය | ඉපයූ ලාභය |
|---|---|
| 2007 | 779,313 |
| 2008 | 11,580,578 |
| 2009 | 49,915,902 |
| 2010 | 95,956,902 |
| 2011 | 101,032,277 |

(ඇ) 1979 අංක 01 දරන පාරිභෝගිකයින් ආරක්ෂා කිරීමේ පනත.

එස්එල්එස් සහතික ලාංඡනය අනිවාර්ය කර ඇති දේශීය නිෂ්පාදන ආයතන 39 ක එස්එල්එස් සහතිකයේ වලංගු කාලය ඉක්මවා ගොස් තිබුණද, නැවත ලියාපදංචිය අළුත් කිරීම විවිධ හේතු නිසා අතපසුවී තිබුණි.

(ඈ) 1997 පෙබරවාරි 03 දිනැති හා අංක 8/97 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය.

අතිකාල ගෙවීම මසකට පැය 20 ක උපරිමයකට සීමා වියයුතු අතර, විශේෂ හේතු මත උපරිම සීමාව ඉක්මවන්නේ නම් ඒ සඳහා දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ නිර්දේශ මත අමාත්‍යාංශ ලේකම්ගේ අනුමැතිය ලබාගත යුතු වුවත්, එසේ අනුමැතියකින් තොරව ප්‍රමිති ආයතනයේ රියදුරන්ට හා අනෙකුත් නිලධාරින්ට ඉහත සීමාව ඉක්මවා අතිකාල ගෙවා තිබුණි.

(ඇ) 2006 ජූලි මස 14 දිනැති හා අංක 2006/11 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය.

නිල වාහන හිමිකම් ඇති නිලධාරින්ට අනුයුක්ත කරනු ලැබූ රියදුරන්ට හිමි අතිකාල පැය 100 ක් වන අතර, එම ප්‍රමාණය ඉක්මවන අවස්ථා වලදී අමාත්‍යාංශ ලේකම්ගේ අනුමැතිය ලබාගෙන නොතිබුණි.

(ඉ) 2006 ජූලි 01 දිනැති හා අංක 144/28 දරණ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට්පත්‍රය

i. එක්තරා වෙළෙඳ නාමයක් යටතේ ජීඅයි පයිප්ප ආනයනය කර තිබූ අවස්ථා 45 ක නියැදියෙන් 41 ක් ම ශ්‍රී ලංකා ප්‍රමිතියට අනුකූල නොවූ අතර, තවත් අවසථා 4 කදී ආනයනික භාණ්ඩ නිදහස් කිරීමට අවසරදී නොතිබියදී ද, 2010 දෙසැම්බර් 04 දින සිට වර්ෂ 03 කට ලියාපදිංචිය අළුත්කරදී තිබුණි. ආන්තික ව්‍යතිරේකයන් සැලකිල්ලට ගෙන භාණ්ඩ නිදහස් කළ බවත් එයින් භාවිතා කරන්නන්ට බලපෑමක් නොවන බවත්, සභාපතිවරයා දැනුම්දී තිබුණි.

ii. ශ්‍රී ලංකා ප්‍රමිත 829:2009 අනුකූල නොවූ අවස්ථා

| වර්ෂය | ආනයන කරුවන් ප්‍රමාණය | ආනයනය කළ ප්‍රමාණය (කි.ග්‍රෑම්) | සාම්පල් ප්‍රමාණය | අසාර්ථක අවස්ථා |
|---|---|---|---|---|
| 2011 | 12 | 3,621,375 | 13 | 06 |
| ජ'ටිඑල් | - | 265,455 | 05 | 03 |

(ඊ) ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනයේ ජ්එල්/සීපී/02 දරන පිළිවෙත් පත්‍රිකාව

වාර්ෂික ගාස්තුවෙන් කාර්තුවකට නියමිත මුදල එම කාර්තුව අවසන් වීමට ප්‍රථම ගණුදෙනුකරු විසින් නොගෙවන අවස්ථාවලදී ප්‍රමාද ගාස්තු ලෙස 10% ක දඩයක් අය කළයුතු වුවද, දඩ අය කිරීමට කටයුතු කර නොතිබුණි. මෙම පත්‍රිකාවට අනුව වාර්ෂික ගාස්තු අය කිරීම අදාළ ආයතනයේ වාර්ෂික විකුණුම් වටිනාකම පදනම් කරගෙන සිදුවිය යුතු වුවද, එකී විකුණුම් වටිනාකම නිවැරදි ආකාරයෙන් තහවුරු කරගෙන නොතිබුණි.

(උ) රජයේ මුදල් රෙගුලාසි මු.රෙ.757(2) හා මු.රෙ.102

භෞතික තොග සමීක්ෂණයේදී අනාවරණය වූ ඌනතා හා හානි වූ භාණ්ඩ සම්බන්ධයෙන් ක්‍රියාකළ යුතු වුවද, එසේ කර නොතිබුණි. තවද, සමාලෝචිත වර්ෂයේ රු.252,762,374 ක් වූ ස්ථාවර වත්කම් සම්බන්ධයෙන් භාණ්ඩ සමීක්ෂණ වාර්තා විගණනයට ඉදිරිපත් නොවුණි.

(ඌ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය

(i) viii පරිච්ඡේදයේ 10 ඡේදය

සති අන්ත හා රජයේ නිවාඩු දිනවල සේවය කිරීම වෙනුවෙන් 1/20 දීමනාව ලබා ගැනීම සඳහා දිනකට පැය 8 කට නොඅඩු කාලයක් සේවය කළයුතු වුවත්, එම අවශ්‍යතාවයට පටහැනි අයුරින ප්‍රමිති ආයතනයේ නිලධාරීන්ට පැය 8 කට වඩා අඩු කාලයක් සේවය කිරීම වෙනුවෙන්ද සම්පූර්ණ දීමනාව ගෙවා තිබුණි.

| | |
|---|---|
| (ii) xxiv පරිච්ඡේදයේ 4.5 ඡේදය | වර්ෂ 1992 සිට සේවය හැර ගිය නිලධාරීන් 14 දෙනෙකුගෙන් ආපදා ණය වශයෙන් රු.243,790 ක් අයකරගත යුතු වුවද, දැනට සේවයේ යෙදී සිටින ඇපකරුවන්ගෙන් හෝ අදාළ මුදල් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. |
| (ඵ) **2006 ජනවාරි 25 දිනැති ජාතික ප්‍රසම්පාදන මාර්ගෝපදේශය** | |
| (i) 2.4.1(අ) | ප්‍රසම්පාදන ක්‍රියාවලිය සඳහා ප්‍රසම්පාදන කමිටුව හා තාක්ෂණ ඇගයීම් කමිටුව සම්පූර්ණ ප්‍රසම්පාදන ක්‍රියාවලිය ක්‍රියාත්මක කළයුතු වුවද, වාහන කුලියට ගැනීම සඳහා තාක්ෂණක ඇගයීම් කමිටුවක් පත්කර නොතිබුණි. |
| (ii) 9.3.1(ආ) | රු.100,000 ට වැඩි අළුත්වැඩියාවන් සඳහා රේඛීය අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ අනුමැතිය ලබාගත යුතු වුවත් KI - 4238 දරණ වාහනය වෙනුවෙන් රු.1,069,156 ක අළුත්වැඩියා වියදම් සඳහා එවැනි අනුමැතියක් ලබාගෙන නොතිබුණි. |

### 1.2.6 අවිධිමත් ගනුදෙනු

පහත සඳහන් අවිධිමත් ගණුදෙනු නිරීක්ෂණය විය.

**(අ). පැමිණීම පදනම් කරගෙන දීමනා ගෙවීම.**

2003 ජුනි 02 දිනැති අංක PED/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 8.3.3 ඡේදය හා 2009 මැයි 26 දිනැති අංක 39 දරන රාජ්‍ය කළමනාකරණ චක්‍රලේඛ වලට පටහැනිව අධ්‍යක්ෂ මණ්ඩල තීරණයක් මත කාර්ය මණ්ඩලයට එක් අයෙකුට රු.8,000 බැගින් පැමිණීම පදනම් කරගෙන දිරි දීමනා ගෙවා තිබූ අතර, සමාලෝචිත වර්ෂයේදී භාණ්ඩාගාර අනුමැතියකින් තොරව, රු.2,842,600 ක මුදලක් පැමිණීම පදනම් කරගෙන දීමනා ලෙස ගෙවා තිබණි.

## 2. මූල්‍ය සමාලෝචනය

2.1 ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ආයතනයේ වැඩ කටයුතුවල ප්‍රතිඵලය රු.101,032,277 ක අතිරික්තයක් වූ අතර ඉකුත් වර්ෂය සඳහා ඊට අනුරූපව රු.95,956,902 ක අතිරික්තයක් විය. මෙම අතිරික්තය වැඩිවීමට හේතුව වෙනත් ආදායම් මිලියන 47 කින් වැඩිවීමත්, පෞද්ගලික පඩිනඩි වියදම මිලියන 25 කින් ඉහළ යාමත් වේ.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 භෞතික කාර්ය සාධනය

2011 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්ම හා තථ්‍ය කාර්ය සාධනය පරීක්ෂාවේදී පහත සඳහන් අපේක්ෂිත ඉලක්ක ඉටුකර ගැනීමට නොහැකිවූ අවස්ථා නිරීක්ෂණය විය.

| | විෂයය | ඉලක්කය | තත්‍ය කාර්යසාධනය |
|---|---|---|---|
| (i) | ප්‍රමිති ආයතන ගොඩනැගිල්ල | රු.30,000,000 ක් වැයකර ප්‍රමිති ආයතනයේ 08 වන මහල ඉදි කිරීම. | 08 වන මහලේ ඉදිකිරීම් කටයුතු ආරම්භ කර නොතිබුණි. |
| (ii) | විද්‍යාත්මක හා ඉංජිනේරු ප්‍රමිති | ප්‍රමිති ප්‍රවර්ධන වැඩසටහන් 08 ක් පැවැත්වීම. | ප්‍රමිති ප්‍රවර්ධන වැඩසටහන් පවත්වා නොතිබුණි. |
| (iii) | රසායනාගාර සේවා | තීන්ත, සපත්තු, සුවඳ විලවුන් හා තේ වැනි නව ක්ෂේත්‍ර සඳහා පරීක්ෂණාගාර සාම්පල් 18 ක් පරීක්ෂා කිරීම. | නව පරීක්ෂණ සාම්පල් පරීක්ෂා කිරීම් සිදුකර නොතිබුණි. |
| (iv) | ක්‍රමාංකන සේවා | Weight force නව Calibration සේවාව සැපයීම. | සේවා සපයා නොතිබුණි. |
| (v) | අලෙවි හා ප්‍රවර්ධන | පාසැල් සිසුන්ට අධ්‍යාපන වැඩසටහන් 10 ක් සංවිධානය කිරීම. | අධ්‍යාපන වැඩසටහන් 05 ක් පමණක් සංවිධානය කර තිබුණි. |
| (vi) | නිෂ්පාදන සහතිකකරණය | • තේ නිෂ්පාදනය සඳහා ප්‍රමිති සහතික යෝජනා ක්‍රමයක් හඳුන්වාදීම. | තේ නිෂ්පාදනය සඳහා ප්‍රමිති සහතික යෝජනා ක්‍රමයක් හඳුන්වාදීමට රු.1,500,000 ක මුදලක් අයවැය ලේඛනය මගින ප්‍රතිපාදනය කර තිබුණද මෙම |

| | | | |
|---|---|---|---|
| | | | යෝජනා ක්‍රමය හඳුන්වාදී නොතිබුණි. |
| | | • තේ නිෂ්පාදනය සඳහා නව ප්‍රමිති සහතික 28 ක් ප්‍රදානය කිරීම. | තේ සඳහා නව ප්‍රමිති සහතික 10 ක් පමණක් නිකුත් කර තිබුණි. |
| | | • සහල් හා පොහොර සඳහා ප්‍රමිති සහතික යෝජනා ක්‍රමයක් හඳුන්වාදීම. | සහල් හා පොහොර සඳහා ප්‍රමිති සහතික යෝජනා ක්‍රමයක් හඳුන්වා දී නොතිබුණි. |
| (vii) | තත්ත්ව සහතිකකරණය | ආනයන පරීක්ෂණ යෝජනා ක්‍රමය සඳහා නව විෂයයන් 30 ක් එකතු කිරීම. | නව විෂයයන් 10 ක් පමණක් එකතු කර තිබුණි. |

## 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

පහත සඳහන් කළමනාකරණ අකාර්යක්ෂමතා නිරීක්ෂණය විය.

(අ) 2010 වර්ෂය සඳහා පවත්වන ලද භාණ්ඩ සමීක්ෂණයේදී පුස්තකාල පොත් 380 ක ඌනතාවයක් වාර්තාවී තිබුණි.

(ආ) රසායනාගාර අංශ විසින් නිකුත් කරනු ලබන පරීක්ෂණ වාර්තා නිකුත් කිරීමේදී සැළකිය යුතු ප්‍රමාදයන් සිදුවී ඇති බව වාර්තා විය.

## 3.3. නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්

ආයතනය සතු පහත සඳහන් වාහන දීර්ඝ කාලයක් තිස්සේ ධාවනයෙන් ඉවත් කර තිබුණද, ඒ සම්බන්ධයෙන් 2004 අගෝස්තු 31 දිනැති හා අංක 353(5) දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාර කටයුතු කර නොතිබුණි.

අංක. 57 - 6208 කැබ් රථය
අංක. 15 - 3216 වැගන් කාරය
අංක. 32 - 2870 වෑන් රථය

3.4 **වෙනත් රාජ්‍ය ආයතන වෙත ලබාදුන් මණ්ඩලයේ සම්පත්**

පහත සඳහන් නිරීක්ෂණයන් කෙරේ.

(අ) ජාතික තරුණ සේවා සභාවෙන් ප්‍රමිති ආයතනයට අනුයුක්ත කර ඇති බව දක්වා කළමනාකරණ සහකාර නිලධාරියෙකු වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේදී රු.244,521 ක මුදලක් ප්‍රතිපූර්ණය කර තිබුණද එවැනි නිලධාරියෙකු ප්‍රමිති ආයතනයට අනුයුක්තව සේවය නොකරන බව විගණනයේදී නිරීක්ෂණය විය.

(ආ). ජාතික ආධුනක හා කාර්මික පුහුණු අධිකාරිය මගින් පුහුණුව සඳහා ප්‍රමිති ආයතනයට අනුයුක්ත කර තිබූ පුහුණු නිලධාරිනියක් තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යාංශයට අනුයුක්ත කර එම නිලධාරිනියට සමාලෝචිත වර්ෂයේදී වැටුප් හා දිරි දීමනා ගෙවා තිබුණි.

(ඇ). ආයතනය සතු අංක.57-6208 දරන කැබ් රථය තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යාංශය වෙත මුදාහැර තිබූ අතර, අක්‍රිය වීමෙන් පසු ආපසු භාරදී තිබුණි. මෙම වාහනයේ අළුත්වැඩියා වියදම් වශයෙන් රු.228,098 ක් ප්‍රමිති ආයතනය වැය කර තිබුණි.

3.5 **කාර්ය මණ්ඩල පරිපාලනය.**

සමාලෝචිත වර්ෂය අවසානය වනවිටත් ඉහළ විධායක තනතුරු 07 ක පුරප්පාඩු පැවති අතර, එයින් සමහර තනතුරු 2004 වර්ෂයේ සිටම පුරප්පාඩු වී තිබුණි.

3.6 **වාහන උපයෝජනය**

ආයතනය සතුව වාහන 19 ක් පැවතියද රියදුරු තනතුරු 3 ක් පුරප්පාඩුව පවතින බැවින් කුලී වාහන 5 ක සේවාවද, ඊට අමතරව කැබ් රථ සේවාවද ලබාගෙන තිබුණි. සමාලෝචිත වර්ෂය තුළදී කුලී වාහන ලබා ගැනීම වෙනුවෙන් ගෙවා තිබූ මුදල රු.4,921,124 ක් විය.

3.7 **ප්‍රමාද වූ ව්‍යාපෘති**

සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් දිරි ගැන්වීමේ ව්‍යාපෘතිය

(i) සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්තකරුවන්ට තත්ත්ව සහතික ලබාදීම සඳහා රු.30,329,577 ක ප්‍රතිපාදනයෙන් අදියර දෙකකින් ක්‍රියාත්මක කරන ලද ඉහත ව්‍යාපෘතියේ අරමුණ වෙනුවෙන් වැය කර තිබූ මුදල රු.10,040,897 කි. එනම් මුළු ප්‍රතිපාදනයෙන් 33% ක් වූ අතර වෙනත් වියදම් සඳහා 53% ක් වැය කර තිබුණි.

(ii) 2010 වර්ෂයේදී නිම කිරීමට යෝජිතව තිබූ ව්‍යාපෘතිය 2011 වර්ෂයේදීද අවසන් කර නොතිබුණි. මෙම ව්‍යාපෘතිය ඉදිරියට පවත්වාගෙන යාම සඳහා භාණ්ඩාගාර අනුමැතිය ලැබී නොතිබූ අතර ඉතිරි මුදල වූ රු.4,079,759 ක් ජංගම ගිණුමේ අක්‍රියව පැවතුණි.

(iii) ප්‍රමිති ආයතනය හා සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්තකරුවන් සමග ගිවිසුමේ 5.1 ඡේදයට අනුව තත්ත්ව සහතිකය ලබා නොගතහොත් ලබාගත් මුදල් ආයතනයට ආපසු ගෙවිය යුතු වුවද, අදියර 1 හා 11 හිදී ලබාදුන් රු.1,354,475 ක් සඳහා තත්ත්ව සහතික ලබා ගැනීමට හෝ මුදල් ආපසු ගෙවීමට කටයුතු කර නොතිබුණි.

(iv) මෙම ආධාර ක්‍රමය යටතේ සහතික ලබාගත් පහත සඳහන් ආයතන විසින් වාර්ෂික ගාස්තු ගෙවීම පැහැර හැර තිබුණි.

| ආයතනයේ නම | බලපත්‍රය වලංගු කාල සීමාව | වාර්ෂික බලපත්‍ර ගාස්තු ගෙවීම |
|---|---|---|
| ගෝල්ඩන් ෆාම් ක්‍රාෆට්(පුද්.) සමාගම | 2007.12.19-2010.12.18 | එක් වර්ෂයක් සඳහා පමණි. |
| බෝටියාවත්ත කෝයර් ෆයිබර් එක්ස්පෝර්ට්ස් | 2008.07.30-2011.07.29 | ගෙවා නැත. |

(v) ආයතන 5 ක් වාර්ෂික බලපත්‍ර ගාස්තු ගෙවූ බවට ලිඛිත සාක්ෂි විගණනයට ඉදිරිපත් නොවීය.

## 4. ගිණුම් කටයුතු භාවය සහ යහපාලනය

### 4.1 අයවැය පාලනය

ආයතනයේ ආදායම් සම්බන්ධව අයවැය ගත අගයන් හා තත්‍ය අගයන් සැසඳීමේදී 21% සට 466% ක් දක්වා විචලනයන් පැවති බැවින් සංයුක්ත සැලැස්ම/ක්‍රියාකාර සැලැස්මට අනුරූප වූ අයවැය ලේඛනය පිළියෙල කර නොමැති බව නිරීක්ෂණය විය.

5. **<u>පද්ධති හා පාලන</u>**

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින් වර ආයතනයේ සභාපති වෙත යොමු කරන ලදී. පහත දැක්වෙන පාලන ක්ෂේත කෙරෙහි අවධානය යොමුවිය යුතුය.

(අ) භාණ්ඩ සමීක්ෂණය.

(ආ) ස්ථාවර වත්කම් ලේඛණය පවත්වා ගැනීම.

(ඇ) ණයගැති පාලනය.

(ඈ) ආනයන පරීක්ෂාව.

(ඉ) පරීක්ෂණ වාර්තා නිකුත් කිරීම.

(ඊ) ජාතික තත්ත්ව සම්මාන උළෙල පැවැත්වීම.